// # ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2092/17 – 2018 ඔක්තෝබර් 09 වැනි අඟහරුවාදා – 2018.10.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 පෙබරවාරි මස 07 වැනි දින අංක 1796/18 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2013 අංක 41 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 වන උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/එල්ආර්බී/18.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය:
ඩබ්ලිව්ජීඑස්ඩබ්ලිව්ඩී සහ ර්අයිපී/ඒසීකිව්/කේබී/07.
2018 ඔක්තෝබර් මස 02 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල, අංක 535 සී, පැපිලියාන නැගෙනහිර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, දිවුලපිටිය, පැපිලියාන, ගංගොඩවිල ගම්වල පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක කො 9467 සහ 2018.06.14 දිනැති සංශෝධිත මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් සහ ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 39 – සුනේත්‍රාදේවී පාරේ වරි. අංකය සොයාගත නොහැකි ඉඩමේ කොටසක් – ප්‍රමාණය: හෙක්. 0.0069**

උතුරට: සුනේත්‍රාදේවී පාරේ වරි. අංකය සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම සහ කැබලි අංක 40; නැගෙනහිරට: කැබලි අංක 40 සහ 4; දකුණට: කැබලි අංක 4 සහ සුනේත්‍රාදේවී පාරේ වරි. අංකය සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම්; බටහිරට: සුනේත්‍රාදේවී පාරේ වරි. අංකය සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම්.

10 – 1301

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 දෙසැම්බර් මස 19 වැනි දින අංක 1841/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යටතේ පළකරන ලද 2013 අංක 391 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 08 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/එල්ආර්බී/117.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරීගේ අංකය:
ඩබ්ලිව්ජීඑස්ඩබ්ලිව්ඩීසහර්අයිපී/ඒසීකිව්/එම්එච්/06.
2018 ඔක්තෝබර් මස 02 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 526/බී - ගංගොඩවිල දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ගංගොඩවිල (මහරගම නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක කො 9679 සහ 2018.06.25 දිනැති සංශෝධිත මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් සහ ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

**01. කැබලි අංක 33 – මිල්ලගහකුඹුර සහ මිල්ලගහදෙනිය – ප්‍රමාණය: හෙක්. 0.2920**

උතුරට: මූ.පි.කො. 9679 හි කැබලි අංක 28, රබර්වත්ත පාරේ වරි. අංක 19/1 දරන දාස් කංකානම්ලාගේ ලලිතා පෙරේරා හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට: රබර්වත්ත පාරේ වරි. අංක සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි ඉඩම, වරි. අංක 17 දරන රේණුකා කුමුදුනී පෙරේරා හිමිකම් කියන ඉඩම, වරි. අංක 17/1 දරන තෙන්නකෝන් මුදියන්සේලාගේ අමරසේන හිමිකම් කියන ඉඩම; දකුණට: රබර්වත්ත පාරේ වරි. අංක සොයාගත නොහැකි එම්. ආර්. රූපසිංහ හිමිකම් කියන ඉඩම, වරි. අංක 13/4 දරන මුදියන්සේලාගේ ලාල් අත්තනායක සහ තවත් අය හිමිකම් කියන ඉඩම, වරි. අංක සොයාගත නොහැකි දයාරත්න හිමිකම් කියන ඉඩම සහ ප්‍රවේශ මාර්ගය; බටහිරට: කැබලි අංක 32.

10 – 1302

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2015 සැප්තැම්බර් මස 30 වැනි දින අංක 1934/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2015 අංක 158 හා 2015.09.25 වැනි දින දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 08 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, පහත උපලේඛනයේ සඳහන් අංක කේජ්/ඩීආර්එන්/2010/149 හා 2010.11.19 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අංක 1 සහ 2 යන ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: එල්ඩී/05/2010/වීර්/74.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: ඩීර්ආර්/එල්ජ්එන්/එල්ඒකිව්යූඅයි/ඒ1/5.
2018 සැප්තැම්බර් මස 28 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අටවුගම් කෝරළේ නැගෙනහිර සුළු කොට්ඨාසයේ, දැරණියගල දකුණ ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙළ කරන ලද අංක කේජ්/ඩීආර්එන්/2010/149 හා 2010.11.19 දිනැති ප්‍රගමන අනුරේඛනයේ දක්වා ඇති නම්වලින් සහ ප්‍රමාණවලින් යුත් ඉඩම් කොටස්වලට මායිම්:

**01. කැබලි අංක 1 – පලාදෙනිය වත්ත – ප්‍රමාණය: හෙක්. 3.0395**

උතුරට: වතු පාර සහ අ.ග.පි. 621 හි කැබලි අංක 1142; නැගෙනහිරට: අ.ග.පි. 621 හි කැබලි අංක 1142 සහ ඇළ; දකුණට: ඇළ සහ අ.ග.පි. 621 හි කැබලි අංක 359; බටහිරට: අ.ග.පි. 621 හි කැබලි අංක 1142, ඇළ (වියළි), අ.ග.පි. 621 හි කැබලි අංක 1102 සහ වතු පාර.

**02. කැබලි අංක 2 – පලාදෙනිය වත්ත – ප්‍රමාණය: හෙක්. 1.0103**

උතුරට: ඇළ සහ අ.ග.පි. 621 හි කැබලි අංක 1142; නැගෙනහිරට: අ.ග.පි. 621 හි කැබලි අංක 1142; දකුණට: අ.ග.පි. 621 හි කැබලි අංක 1142 සහ මියනවිට ගම (අ.ග.පි. 623); බටහිරට: ඇළ.

10 – 1303

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.